

# බාධක මැදින්........

මෙය දශක හතරකට පමණ ඉහතදී මුහුණ පෑ සිද්ධි මාලාවකි. ඒ මා විද්‍යා. අධ්‍යාපපන නිලධාරිවරයෙකු ලෙස සේවය ආරම්භ කළ මුල් කාලයේදිය. ආසියා පැසිෆික් අධ්‍යාපපන සංවර්ධන ආයතනය (Asia Pacific Institute for Educational Development - APIED) මගින් මෙහෙයවූ ජීව විද්‍යාව වැඩ මුළුවක ශ්‍රී ලංකා නියෝජිතයා ලෙස සහභාගී වීමට මා තෝරාගෙන තිබිණ. අධ්‍යාපන අමාත්‍යංශයෙන් මේ බව මට ලිපියකින් දන්වන ලදී. මා හට පිලිපීනයේ මැනිලා නුවර, පිලිපීන විශ්ව විද්‍යාල විද්‍යා අන්තර්කරණ මධ්‍යස්ථානයේදී (University of Philippines Science Interaction Centre - UPSIC) පවත්වනු ලබන දින අටක, ජීව විද්‍යා අධ්‍යාපනය පිලිබඳ වැඩ මුළුවකට සහභාගී වන ලෙස එම ලිපියෙන් දන්වා තිබිණ. ඒ සමග වැඩ මුළුවේ කාල සටහනද එවා තිබුණු අතර සහභාගී වීමට කැමැත්ත දක්වන ප්‍රකාශයක්ද අත්සන් කර යැවිය යුතුව තිබිණ.

හදිසියකදී ඇමතීම සඳහා දුර කථන අංකයක්ද ඒ මගින් ඉල්ලා තිබිණ. ඒ වන විට මට පෞද්ගලික දුරකථනයක් නොතිබුණු නිසා එවකට උසස් නිලයක් දැරූ අසල්වැසි නිවසක හිතවතෙකුගේ දුරකථන අංකය, ඔවුන් සමග සාකච්ඡා කර අමාත්‍යංශයට යැවීමට කැමැත්ත ලබා ගතිමි. එම දුර කථන අංකය සහ වැඩමුළුවට සහභාගී වීමට මගේ කැමැත්ත දක්වන ලිපියද පසු දිනම තැපැල් කළෙමි.
මට පෞද්ගලික දුර කථනයක් නොතිබීම පළමුවන බාධකයයි.

දින දහයක් පසුවන තුරු අධ්‍යාපන අමාත්‍යංශයෙන් වෙන කිසිම තොරතුරක් නොලැබුණි. එම නිසා, එකොලොස්වන දින අමාත්‍යංශයට ගොස් සොයා බැලීමි. මා දී තිබුණු දුරකථන අංකයට පණිවුඩ දෙකක්ම දුන් බව විෂයය භාර ලිපිකරු මට පවසා, ඒ බවට ගොනුවේ තබා තිබුණු සටහන්ද පෙන්වීය. අසල්වැසියාට මට නියමිත දුරකථන පණිවුඩය ලැබී ඇතත්, එය කුමන හේතුවක් නිසා හෝ මට නොදුන් බව මම පහසුවෙන් වටහා ගතිමි.

මට අධ්‍යාපන අමාත්‍යංශයෙන් දුන් දුර කථන පණිවුඩය අසල් වැසියා විසින් ලබා නොදීම දෙවැනි බාධකයයි.

මේ වන විට මට ගුවන් ගමන් බලපත්‍රයක්ද නොතිබුණි.

අමාත්‍යංශයෙන් විපරම් කළ විට මට දැනගන්නට ලැබුණේ, ඒ ගමනට පමණක් වලංගු හදිසි ගුවන් ගමන් බලපත්‍රයක් ලබාගැනීමත්, ගුවන් ටිකට් පත් ලබාගැනීමත් හැකි තරම් ඉක්මණින්ම කළ යුතු බවයි. මෙම කටයුතු වලට අදාළ අයදුම් පත් කිහිපයක්ද මට විෂයය භාර ලිපිකරු මහතාගෙන් ලැබිණ. ආධුනිකයෙකු වූ මට එම අයදුම් පත් පුරවන ආකාරය තේරුම් කර දීමට කාරුණික වූ ලිපිකරු මහතා, ආගමන විගමන දෙපාර්තමේන්තුවට සහ ගුවන් ටිකට් පත් නිකුත් කරන ආයතනයට දීම සඳහා අවශ්‍ය රාජකාරි ලිපිද වහාම සකස් කර දුන්නේය. කෙසේ වෙතත් ඉදිරි වැඩ කටයුතු සියල්ල සම්පුර්ණ කර ගැනීම සඳහා මට ඉතිරිව තිබුනේ දින දහයක පමණ සුළු කාලයකි.
පසුදිනම ආගමන විගමන දෙපාර්තමෙන්තුවට ගියෙමි. එහිදී අවශ්‍ය ලිපි ලේඛන ඡායාරුප ආදිය සපයා අවශ්‍ය කටයුතු සම්පූර්ණ කරගැනීමට පැය පහක් පමණ ගතවිය. සියල්ල සම්පූර්ණ කර දී, ඒ පිළිබඳව විපරම් කළ විට, විදේශ ගමන් බලපත්‍රය ලබාගත හැක්කේ සතියකින් බව දැනගන්නට ලැබුණි.

ඊ ලඟට අධ්‍යාපන අමාත්‍යංශය මගින් යෝජනා කරන ලද ගුවන් ටිකට් පත නිකුත් කරනු ලබන කාර්යාලයට ගියෙමි. රජයේ වියදමින් යන ගමනක් නිසා එම ගුවන් ටිකට් පතෙහි වියදම රජය මගින් දරන බවට ගිවිසුමක් අමාත්‍යංශ ප්‍රධානියා විසින් අත්සන් කළ යුතු බව එහිදී දැනගන්නට ලැබිණ. එසේම විදේශ ගමන් බලපත්‍රය නොමැතිව ගුවන් ටිකට් පත නිකුත් කළ නොහැකි බවද ඔවුහු පැවසීහ.

මෙය තුන්වන බාධකයයි.

කෙසේ වෙතත් ගුවන් ගමන් ආසන වෙන් කිරීමේ පොරොත්තු ලේඛනයේ මගේ නමද ඇතුලත් කළ හැකි බවද දැන ගතිමි. මෙය තරමක අස්වැසිල්ලක් විය.

ගුවන් ගමන් සහ විදේශ සංචාර වලට ආධුනිකයෙකු වූ මට බොහෝ දේ නිරාකරණය කරගත යුතු විය. මෙවැනි ගමනක් යාමට ලැබී ඇති බව වැඩිපුර ප්‍රචාරය නොකරන ලෙසද කිහිප දෙනෙක් උපදෙස් දුන්හ. මා එවකටත් බාලදක්ෂ සේවයේ නිරතව සිටි නිසා උපදෙස් ලබාගැනීම පිණිස මගේ සමීප හිතවතෙකු වූ ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස් තුමා හමුවීමි. ඔහු මට සියලූ විස්තර පැහැදිලි කරදී අවශ්‍ය වුවහොත් හමුවීම පිණිස මැනිලා නුවර බාලදක්ෂ මුලස්ථානයේ නිලධාරියෙකුට ලිපියක්ද දුන්නේය. සංචාරක චෙක් පත් (Travellers' cheques) මගින් විදේශ මුදල්ද සුළු ප්‍රමාණයක් තමන් ළඟ තිබිය යුතු බවද කී ඔහු එය ලබාගන්නා ආකාරයද විස්තර කර දුන්නේය.

ඔහුගේ කාරුණික භාවයත් ලබාදුන් තොරතුරුත් නිසා මට තරමක හිතේ




සැහැල්ලුවක් දැනුනි.

ඒ කාලයේ විදේශ විනිමය නිකුත් කළේ කොළඹ හෝ ප්‍රධාන නගර වල පිහිටි බැංකු වලින් පමණකි. එදිනම නිර්දේශිත බැංකුවට ගොස් විදේශ මුදල් ලබාගැනීම සඳහා ඉල්ලීමක් කළවිට, ගුවන් ටිකට් පත නොමැතිව විදේශ මුදල් නිකුත් නොකරන බව දැන ගතිමි.
මෙය හතරවන බාධකයයි.

ගුවන් ගමන් බලපත්‍ර ය, ගුවන් ටිකට් පත, විදේශ විනිමය නිකුත් කිරීම යන සියල්ල එකිනෙකට තදින් බැඳී තිබෙන ජාලයක් බව මා දැනගත්තේ එවිටය.

පසුදින නැවත අධ්‍යාපන අමාත්‍යංශයට ගොස් ගුවන් ටිකට් පතෙහි ගාස්තුව සඳහා ගිවිසුමක් අත්සන් කළ යුතු බව ලිපිකරු මහතාට කී විට, ඔහු එවැනි දෙයක් නොදන්නා බව කිවේය. කෙසේ වෙතත්, ඔහු තවත් ඉහළ නිලධාරියෙකු සමග සාකච්ඡා කිරීමෙන් පසු, ඒ පිළිබඳව නිවැරදි තොරතුරු ලබාගෙන, අදාළ ලිපිය ඊට පසු දින නිකුත් කළ හැකි බව කිවේය.
මෙය පස්වන බාධකයයි.

සියල්ලටම ඇත්තේ තව දින කිහිපයකි. ඊට පසු දින නැවත අධ්‍යපෙන අමාත්‍යංශයට ගොස් අදාළ ලිපිය ලබාගන්නා විට පස්වරු දෙක පසුවිය.

පසුදින ආගමන විගමන කාර්යාලයට පැමිණ ගුවන් ගමන් බලපත්‍රය ලබාගතිමි. පැය ගණනක රස්තයාදු වීමකින් පසුව, එදින සවස් වනවිට ගුවන් ටිකට් පතද ලබාගතිමි. කටුනායක ගුවන් තොටින් පිටත් වී, බැංකොක් ගොස් එහි පැය හතරක් සිට මැනිලා නුවරට යන බව ටිකට් පත නිකුත් කළ නිලධාරිනිය මට පැවසුවාය. මාද පළපුරුදු සංචාරකයෙකු ලෙස ඇයට සවන් දුන් නමුත්, ඒ නුහුරු නුපුරුදු දේ මට කිසිසේත් තේරුම් ගැනීමට නොහැකි විය.

ලැබුණු ගුවන් ටිකට් පත තීරු දහයක් දොළහක් තිබුණු තරමක පොත් පිංචකි. අවශ්‍ය ලිය කියවිලි සියල්ලම රැගෙන නැවත බැංකුවට ගොස් විදේශ විනිමය ගැන කථා කළෙමි. සංචාරක චෙක් පත් නිකුත් කරනුයේ නියමිත ගමන ආරම්භ කිරීමට පැය විසි හතරක් ඇතුළතදී පමණක් බව එවෙලේ දැනගතිමි.
මෙය හය වන බාධකයයි.

අවශ්‍ය නම් ගුවන් තොටුපලේ බැංකුවෙන් වුවද විදේශ විනිමය ලබාගත හැකි බවද බැංකු නිලධාරියා කිවේය. ඒ ගැන කිසිවක් නොදන්නා මට එය මහත් ප්‍රහේලිකාවක් විය. ගමනට තව ඇත්තේ දින දෙකකි. විදේශ විනිමය අතේ නැතත් ගමන යා හැකි බව මිතුරෙකුගෙන් දැන ගතිමි. එසේ වුවත් හදිසියකදී වියදම් කිරීම සඳහා යම්කිසි මුදලක් තිබිය යුතු බව ඔහු අවධාරණය කළේය.

එදින සවස ගෙදර යනවිට අධ්‍යාපන අමාත්‍යංශයෙන් ලිපියක් ලැබී තිබිණ. එහි විස්තර කර තිබුණේ මා විසින් වැඩ මුළුවේදී, විෂයයට අදාලව ශ්‍රී ලංකාවේ තත්ත්වය පිලිබඳ ප්‍රගති වාර්තාවක් (Country report) ඉදිරිපත් කළ යුතු බවය. අමාත්‍යංශයට ඉදිරිපත් කළ යුතු විදේශ නිවාඩු අයදුම් පතක්ද ඒ සමග විය. මේ සියල්ලටම ඇත්තේ හෙට දිනය පමණකි. මේ කිසිවක් මට කලින් නොකීවේ ඇයිද යන්න මට මහත් ගැටලූවකි.
මෙය හය වන බාධකයයි.